දුක සැප දෙක බෙදා හදා ගැනීම

"මිතුරු තුමෝ දුක සැප දෙකෙහිම පැවති
බිතු සිතුවම් රූ මෙන් පිටුනොපාවිති"

රාහුල හාමුදුරුවන් මේ කවි දෙපදය ලිව්වේ තේරුමක් නැතිවද යන සැකය මගේ හිතට නැගුණේ -දුක" කියන එක බෙදා ගන්නට පුලුවන් දෙයක් නොවේය කියන අදහස අපේ පත්තරයක කියවන්නට ලැබුණු මොහොතේ ය. ලියුවේ වියත් තෙර තමකි.

දුක නැතහොත් දුක් විඳීමේ සංකල්පය අල්ලා ගෙන බුදු දහම සමච්චලයට ලක් කිරීමට සමහර අපරදිග්‍රවන් ඉඳ හිට නැත් කළ හා කරන බව පෙනෙයි. -ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා" ආදී වශයෙන් සමස්ත ජීවිතය - සසර සැරි සැරීම - දුකක් ය යන අදහස වැරදි විදියට වටහා ගන්නන් එය විග්‍රහ කරන්නේ එමගින් බෞද්ධයන් නිරන්තරයෙන් කම්මුලට අත තියාගෙන සිටිය යුතු පිරිසක් වන හෙයින් ඔවුන්ගේ දිවියේ සැපක් කියා දෙයක් නැති විදියට ය. මේ නම් දුක අල්ලා ගෙන කෙනකුට ගිය හැකි අනෙක් අන්තය මිස වෙනෙකක් නොවේ.

"අපි ඔබ සමග ඔබේ දුක බෙදා හදා ගන්නෙමු" යයි කියන කියමන මේ රටේ උදවියගේ මුවින් නිතර පිටවන්නකි. එය ඔවුන්ට පුරුදු වූ කියමනක් පමණක් නොව පොදුවේ ඕස්ට්‍රේලියානුවන්ගේ ජීවිතයට ප්‍රවිෂ්ට වූ ඉතා වටිනා ආකල්පයක් නොහොත් ක්‍රියා පිළිවෙලක් බවත් අවධාරණය කළ යුතු ය. කෙනකුගේ උර මත (ගිස ඔබාගෙන) අඩන්නට ලැබෙන අවසරය කවරකුගේ වුව චිත්ත සංතාපය තිවා ගැනීමෙහි ලා ප්‍රයෝජනවත් ආධාරකයක් වශයෙන් ද මේ රටේ සලකනු ලබන බව කිව යුතු ය. මට තේරෙන විදියට නම් එහි ලා කියැවෙනුයේ අර දුක බෙදා ගන්නට සැරසුණ තවෙකකුගෙන් ලැබෙන අනුග්‍රහය ගැනය. එබඳු අවස්ථාවකදී දුකට පත් වූ තැනැත්තාගේ එම දුක ගැන සංවේදීව ඔහුගේ නොහොත් ඇයගේ සිත් සනසා ලනු වස් දිය යුතු මානසික හා භාවමය අනුග්‍රහය දීමට තමා සැදි පැහැදි සිටින බව කියන්නකුගේ ක්‍රියාව ය.

පවුලේම කෙනකු නොහොත් ඉතා සමීප ගිතවතකු බදා ගෙන අඩහවා දකින්නට ලැබුණත් මේ විදියට කෙනකුගේ උර මත වැළපෙන සිරිතක් ශ්‍රී ලංකාවේ දී අපේ ගම්වල නම් මා දැක නැත. ඒ පුරුද්දට පටහැණි වූවක් ලෙසින් එදා මා දුටු දර්ශනයක් ඇත . දැනට වසර තිස් ගණනකට උඩ දී එය සිදු වූයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී ය. මගේ හිතවතකු වූ ලන්ඩන් වාසී ඡර්ලි ගුණතිලක ශ්‍රී ලංකාවට ආ ගමනකදී රෝගාතුරව රෝහලේදී මිය ගියේ ය. ඔහුගේ බිරිය වූ විශාඛා පැමිණියේ මරණය ගැන දැනගත් පසු ය. ඇය පිළිගැනීමට ගොස් සිටි පිරිස අතර සමසමාජ නායකයකු වූ ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා ද සිටියේ ය. මොවුන් ඉදිරියට පිය නැගූ විශාඛා ගුණතිලක එක් වරම කළේ කොල්වින් ගේ ළය මත හිස ඔබාගෙන වැළපීම ය. ඔහුගේ උර මතට හිස තබන්නට ඇය උස මඳි නිසා ය. එම අනුවේදනීය දර්ශනය අද අපට හුරු පුරුදු ඕස්ට්‍රේලියානු වාරිත්‍රයට දිය හැකි හොඳම ශ්‍රී ලාංකික නිදර්ශනය බව කියමි. ගුණතිලක පවුල උගු සමසමාජකාරයෝ වූහ.

නැවතත් රාහුල හාමුදුරුවන්ගේ කවි දෙපදය වෙතට යොමු වෙමි. සිංහල සාහිත්‍යයේ අතිප්‍රබල පැවිදි පඬිවරයා හැටියට අප පිළිගන්නා ඡඩිභාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජ මාහිමිපාණන් අරහෙම කිව්වේ (ලිව්වේ) තමා දෙන පණිවුඩය රැගෙන කැළණිය බලා පිටත් වන දූතයා එනම් සැළලිහිණියා ගැන ය. මිනිස් පරාණයක් ගැන නොවේ. මේ වාගේ සතකු තමාගේ කළණ මිතුරකු ලෙසින් සැළකීමට උන් වහන්සේ කල්පනා කළේ ඇයි? නිකම් මිතුරකු නොව දුක සැප දෙකෙහිම පිහිට වන මිතුරකු ලෙසින් දකින්නට? ඒ කියන්නේ -හොඳ කාලගුණය තියෙන වෙලාවට සිටින මිතුරන්" වශයෙන් ඉංගිරිසියෙන් හැඳින්වෙන වාසිය බලාගෙන ළං වෙන මිතුරන් ගැන නොවේ. කිසිසේත් නොසැලෙන මිතුරන්ගේ ගණයට ඇතුළත් කරනු ලැබූ රාහුල හාමුදුරුවන්ගේ සැළලිහිණියා අතිවාර්යයෙන් අපට සිහිපත් කරන්නේ මහෞෂධ පණ්ඩිතයන්ගේ ගිරා පෝතකයා ය. ඒ ගිරා පෝතකයා විසින් කටදළුවාගෙන උඩ බලන කේවට්ටයාට කරනු ලබන සංග්‍රහය ගැන ය.

එහෙත් මේ ගිරා පෝතකයාගේ වර්වස් පිඩ මතක් කොට සිනාසෙන විදියේ සහෘදලු කරුණක් නොවේ. ඊට වඩා බරපතල අදහසක් ගැන කියන කතාවකි. අනෙක් අතට රාහුල හාමුදුරුවන් දුක ගැන නොදැන සිටි පැවිද්දකු යයි හෑල්ලු කරන්නටත් බැරිය. ඒ අනුව උන් වහන්සේ තමාගේ විශිෂ්ට කාව්‍යයෙහිලා මේ කියන්නේ අප කවුරුනුත්

එදිනෙදා කතා බහේදී යොදා ගන්නා වූ බණ ගැන නොසිතාම ඕනෑම පොඩි එකෙකුට වුවත් හොඳාකාර තේරුම් ගත හැකි කාරණාවක් ගැන ය. තවත් දෙයක් කිව යුතු ය. මේ කියන දුක විජ්ලවකාරයන් සටන් කරලා බේරා ගන්නට තැත් කරන ජනතාව විඳින්නා වූ දුකෙන් වෙනස් වන්නකි. මේ වචනය ආගමික පක්ෂයෙන් විග්‍රහ කිරීමට හයියක් මට නැතත් මේ කියන්නේ ගතටත් හිතටත් වේදනාවක් ඇති වූ විට හට ගන්නා හැඟීමක් වශයෙන් තේරුම් කරන්නට පුලුවන. එහෙම වෙලාවට කර කියා ගන්නට දෙයක් නැත්නම් අප කවරකු තුළ වුවත් හට ගන්නේ දුකක්ම ය. මා මෙසේ විග්‍රහ කරන්නේ වචනයේ අව්‍යාප අර්ථය හිතේ තබාගෙන ය.

මා මේ කියන දුක උරුම කොට ගෙන උපදින අයත් ඇත. එබන්දන්ගේ දිවිය පටන්ගැන්මේ සිටම දුකින් පිරුණකි. ඉදිරියට තබන හැම පියවරක්ම වේදනාකර ආයාසයකි. දුක් විඳිනවා යයි කියන්නට ඒ විදියටම විඳවන්නට උවමනා නැත . සුඛෝපභෝගී ජීවිතයක් උරුම කර ගත්තන්ට පවා දරා ගත නොහැකි පාඩුවක් නොහොත් වියෝගයක් ඇති වූ කල්හි හට ගන්නා දුක කාටත් පොදු ය. එබඳු හැඟීමක් කිසි විටක සිතට නොපිවිසෙන සුපිරි ගණයේ පුද්ගලයකු ඇතොත් ඔහු හෝ ඇය සුපිරි මිනිසත්බවක් ඇත්තෙකි. අනෙක් අතට කෙළෙස් නොතැවුවත් දුකක් නිසා කම්පාවට පත් නොවී නිස කෙළින් කරගෙන සිනා මුහුණින් සිටීමට සමත් පුද්ගලයෝ ද සිටිති. එබඳු විරල ගණයේ පුද්ගලයන්ට වුවත් දුක දැනෙන බව නම් කිව යුතු ය. එහෙත් ඔවුන්ට තමාගේ දුක බෙදා හදා ගන්නට අනෙකකු අවශ්‍ය නොවනු ඇත. තනිවම එය දරා ගැනීමේ ශක්තියක් ඔවුන් සතුව ඇති නිසා ය. වැඩි දෙනා එසේ නොවන්නෝය. තමාගේ දුක තුනී කර ගැනීමට අනෙකකුගේ පිහිට නොලැබෙන විට ඔවුනු තවත් අසරණ වන්නෝ ය.

කෙනකුගේ දුක බෙදා ගැනීමට ඉදිරිපත් වන අවංක මිනිසා නොහොත් ගැහැනිය හඬා වැළපෙන්නේ නැත. ඔහු හෝ ඇය ක්‍රියා කරන්නේ ඊට වඩා වගකීමක් ඇතිවය - සන්සුන් විදියට ය. සිහි නුවණින් ය. කොටින්ම එම පුද්ගලයා වෙතින් ප්‍රකාශ වනුයේ ශෝකයට වඩා තමා තුළ පවත්නා සංවේදිතාව ය. තමාට අනෙකාගේ වේදනාව හොඳින් අවබෝධ වන බව වචනයෙන් පමණක් නොව ඉරියව්වෙන්ද ප්‍රකාශ කිරීමට ඒ තැනැත්තා සමත් වන්නේ ය. ඒ වුකලී හුදෙක් අව්‍යාප ප්‍රකාශනයක්ම ය.

මෙසේ ඉදිරිපත්වන්නා තුළ අනෙකාගේ දුක ගැන හිත උණුවීමක් ඇත . පොදු වහරේදී අප පපුවේ තෙතමනයක් ඇත්තන් හැටියට හඳුන්වන්නේ එම ගුණය සහිත පුද්ගලයන් ය. බොහෝ විට ඒ තෙතමනය ක්‍රියාත්මක වන්නේ තමාගේ හිතවතකු ගැන පමණක් විය හැකි ය. එසේ නැතිව කවරකුගේ වුවත් දුක දකින විට උණු වන හදවතක් සහිත පුද්ගලයා වෙතින් ඊටත් වඩා උසස් මිනිස් ගුණයක් ප්‍රකාශ වන බව කිව හැකි ය. මෙය අවධාරණය කළ යුත්තේ අනුන්ගේ දුක දැක සතුටු වන්නන්ද ඉඳ හිට වුව දක්නට ලැබෙන නිසා ය. යට කී උසස් මිනිස් ගුණයම අපි කරුණාව ලෙසින් ද හඳුන්වමු. කරුණාව වුකලී ටික දෙනකු වෙත පමණක් සීමා කළ හැකි දෙයක් නොව පොදුවේ කවරකුගේ වුවත් දුක දැක හටගන්නා සුපිරි හැඟීමකි. තවකකුගේ දුක බෙදා හදා ගන්නට ඉදිරිපත්වන්නා තුළ යට කී සුපිරි ගුණය ඇත්තේ නම් ඔහු හෝ ඇය එසේ දුක බෙදා හදා ගැනීමේ දී අනිවාර්යයෙන්ම එම සුපිරි ගුණය පිළිබිඹු කරනු ඇත .

දුක බෙදා හදා ගන්නට බැරි දෙයකැයි කියන්නන්

වාගේම දුක යනු කෝපය නොහොත් තරහව බඳු පිටු දැකිය යුතු මිනිස් දුබලතාවකැයි කියන්නෝද ඇත . ඔවුන් කරන්නේන් බුදු දහම හාස්‍යයට ලක්කිරීමට තැත්කරන්නන් වාගේම පොට වරදදා ගැනීමකි. අප දුක බොදා හදා ගැනීම ගැන නිතර දෙවේලේ කීමේදී පමණක් නොව එදා රාහුල හාමුදුරුවන් සැළලිහිණි මිතුරා ගැන කීමේදී ද අදහස් කරන්නේ - අදහස් කළේ - බුදුන් වදාළ චතුරාර්ය සත්‍යයට අයත් දුක්ඛ සත්‍යය නොවේ. ලෝ වහරට අනුව සාමාන්‍ය ජනයා හැමදාමත් යොදා ගන්නා අදහස නොහොත් සංකල්පයයි.

දුක යනු තරහව යයි ලියා තිබුණේ ද අර මුලින් කී ලිපියේම ය.

Make a Difference – Cure Shehan

A Donor Drive to Cure Shehan AND Help Others in Need

Shehan's story

Shehan is 33 years of age and has a 3 month old son. Early this year he was diagnosed with Leukaemia, soon after the birth of his son. He is now in urgent need of a blood STEM CELL TRANSPLANT to increase his survival chances. Shehan is Sri Lankan by ethnicity and due to the small number of South Asians on the donor registries, he has not been able to find a suitable donor.

Who Can Help?

- **ANYONE** between the age of 18-45 can HELP
- It doesn't matter what GENDER you are
- Donor's who are South Asian, in particular Sri Lankan have a higher chance of being a MATCH
- If you do not fall into the above ethnic groups, please still join the registry via the Red Cross - You can still be the difference in some ones fight for life

How does it Work?

The process of becoming a donor is very SIMPLE!

Step 1) On Tuesday, 28th June you will be asked to give **1 ½ Teaspoon of blood** (3-5ml) to test if you are a MATCH

Step 2) The Red Cross will process your information and add you to the Australian donor registry

Step 3) If you are a MATCH you will be contacted by the Red Cross at a later date

All Costs are covered by the Australian Health System. Please refer to www.abmdr.org.au for more detail.

GIVE BLOOD SAVE LIFE

When Is it?

Date	Location	Time	Contact
Tuesday 28/06/11	Burgher Assoc. Hall 358 Houghton Road, Clayton, Victoria, 3168 (Next to Cricket Grounds)	2p.m to 7p.m	Genny Scholkman 0424 892 283

Did you Know?

The global donor registry has the smallest number of Asians particularly Sri Lankan's. **The chances of finding a match are 1 in 20,000**. So whatever you can do to help will be a great service to the entire community and for our future generations

Note: It will be appreciated if donors who can, to come in between 2- 5 pm as we are expecting a rush after office hours (5 – 7 pm)

You Can Be the MIRACLE

Reach Us! www.facebook.com/cureShehan GetInvolvedToday@Hotmail.com